# මාධ්‍ය නිවේදනය

## 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.1 ක වර්ධනයක් වාර්තා කරයි.

**ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම**

2017 වර්ෂයේ සිව්වන කාර්තුව සහ සමස්ත වර්ෂය සඳහා


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


..............................................................................................................

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 සිව්වන කාර්තුව සහ 2017 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

වර්ෂ 2017 (ජනවාරි සිට දෙසැම්බර්) සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 9,315,488 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2016 වර්ෂයේ දී මෙහි අගය රුපියල් මිලියන 9,034,290 ක් විය. ඒ අනුව 2017 වර්ෂය සඳහා ආර්ථික වර්ධන වේගය සියයට 3.1 ක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කොට ඇත.

පවත්නා මිල ගණන් යටතේ 2017 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික ආර්ථික කටයුතු විසින් දෙනු ලැබූ දායකත්වය සියයට 7.7 කි. කර්මාන්ත හා සේවා අංශ පිළිවෙලින් සියයට 27.2 ක සහ සියයට 55.8 ක දායකත්වයක් දළ දේශීය නිෂ්පාදිතය සඳහා ලබා දී ඇති අතර භාණ්ඩ මත අයකෙරෙන ශුද්ධ බදු (සහනාධාර අඩු කළ) දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 9.3 ක දායකත්වයක් ලබා දී ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාමින් දිවයිනේ බොහෝ දිස්ත්‍රික්කවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් (දැඩි නියගය හා අධික වර්ෂාව) නිසා කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2017 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී හැර පසුගිය වර්ෂ දෙක මුළුල්ලේ ම වාර්තා කර ඇත්තේ සෘණ වර්ධන වේගයන් ය. ඒ අනුව 2017 වර්ෂය සඳහා ද කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 0.8 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. එනමුත් 2017 වර්ෂයේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 3.9 ක සතුටුදායක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එසේ ම සේවා කටයුතු සියයට 3.2 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත.

### කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2017 වර්ෂය තුළ කෘෂිකාර්මික ආර්ථික කටයුතු වාර්තා කර ඇත්තේ සියයට 0.8 ක සෘණ වර්ධනයකි. එහි දී පොල් ඇතුළත් වන"තෙල් සහිත පළතුරු බෝග වගාව", "එළවලු වගා කිරීම", "වී හැර අනෙකුත් ධාන්‍ය වගාව", "වී වගා කිරීම" සහ "කරදිය ධීවර කටයුතු" පිළිවෙලින් සියයට19.5 ක්, සියයට 16.2 ක්, සියයට 10.3 ක්, සියයට 4.0 ක් සහ සියයට 2.0 ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු කිහිපයක් ධන වර්ධන වේගයන් වාර්තා කර තිබීම කැපී පෙනේ. එහිදී "වන වගා හා දැව", "මිරිදිය ධීවර කටයුතු", "පළතුරු වගා කිරීම", "රබර් වගා කිරීම", "තේ වගා කිරීම", "සත්ත්ව නිෂ්පාදන" සහ "කුළුබඩු වගා කිරීම" පිළිවෙලින් සියයට 22.0 ක්, සියයට 10.7 ක්, සියයට 7.4 ක්, සියයට 4.9 ක්, සියයට 4.8 ක්, සියයට 3.9 ක් සහ සියයට 0.5ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

### කර්මාන්ත ආර්ථික කටයුතු

වර්ෂ 2017 දී කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 3.9 ක සැලකිය යුතු වර්ධනයක් අත් පත් කරගෙන ඇත. එහිදී ආර්ථිකය තුළ ඉහළ වැදගත්කමක් උසුලන "ඉදිකිරීම් කර්මාන්තය" සියයට 3.1 කින් වර්ධනය වී ඇත. එසේම "පතල් හා කැනීම් කර්මාන්තය" සියයට 5.9 ක ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතු සඳහා වැඩි දායකත්වයක් සපයන නිමැවුම් කර්මාන්ත කටයුතු 2017 වර්ෂයේ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කර ඇත.

නිමැවුම් කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය" සහ "ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය" යන ප්‍රධාන කර්මාන්ත ආර්ථික කටයුතු ද්විත්වය පිළිවෙලින් සියයට 5.7 ක් සහ සියයට 1.5 ක් වශයෙන් සැලකිය යුතු වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේ ම "රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය", "මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදනය" සහ "යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය" පිළිවෙලින් සියයට 8.7 ක්, සියයට 8.6 ක් සහ සියයට 6.7 ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

වර්ෂ 2017 දී "විදුලිය, ගෑස්,වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම" සියයට 2.7 ක වර්ධන වේගයක් වාර්තා කර තිබේ.

### සේවා ආර්ථික කටයුතු

කෘෂිකාර්මික ආර්ථික කටයුතු සහ කර්මාන්ත ආර්ථික කටයුතු සමග සැසඳීමේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි කොටසක් ආවරණය කරන (සියයට 55.8) සේවා ආර්ථික කටයුතු 2017 වර්ෂයේ දී සියයට 3.2 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. සේවා අංශයේ මෙම සමස්ත වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් ලබා දී ඇති "ගුවන්විදුලි,රූපවාහිනී විකාශන සහ එම නිෂ්පාදන කටයුතු", "විදුලි සංදේශ කටයුතු", "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා කටයුතු", "සෞඛ්‍ය සේවා කටයුතු", "රක්ෂණ කටයුතු" සහ "තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු" පිළිවෙලින් සියයට 13.2 ක්, සියයට 12.0 ක්, සියයට 9.4 ක්, සියයට 7.2 ක්, සියයට 5.7 ක් සහ සියයට 3.8 ක් වශයෙන් ඉහල වර්ධන වේගයන් වාර්තා කර ඇත.

### 2017 වර්ෂයේ සිව්වන කාර්තුව

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කොට ඇති 2017 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,623,541 කි. ඒ අනුව 2017 වර්ෂයේ සිවවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය 2016 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 3.2 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එහිදී කෘෂිකාර්මික කටයුතු සියයට 7.1 ක වර්ධනයක් වාර්තා කරන අතරතුරදී සේවා ආර්ථික කටයුතු සියයට 3.2 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එසේම කර්මාන්ත ආර්ථික කටයුතු 2017 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී සියයට 2.7 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත.

2017 සිව්වන කාර්තුවට සහ 2017 වර්ෂයට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව